2023 මාර්තු

# 5 ප්‍රීතිමත් වැඩිහිටියන් සඳහා පුවත් පත්‍රිකාව

**"වෙනස්වන ලොවක ශක්තිමත් වැඩිහිටියෙක්"**

**ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම**
**2022 ඔක්තෝබර් 01**



## පසුබිම

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මගින් 1990 දී ඔක්තෝබර් පළමු වැනි දින ජාත්‍යන්තර වැඩිහිටි දිනය ලෙස නම් කරන ලදී. වැඩිහිටියන් සඳහා වන ජාත්‍යන්තර දිනය වැඩිහිටියන්හට ගෞරව කිරීම සහ රැකබලා ගැනීම සඳහා වෙන් කර ඇත.

වැඩිහිටි පුද්ගලයින් සමාජයේ නායකයින් ලෙස බොහෝ වගකීම් තම කරමත තබාගෙන සිටිති. ඔවුන් සමාජයේ සම්ප්‍රදායන්, සංස්කෘතීන් ද රැගෙන තරුණ පරම්පරාවට දැනුම ලබාදෙයි. එබැවින් අපගේ සමාජය තුළ වැඩිහිටි පුරවැසියන්ගේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම සහ ඔවුන්ගේ දායකත්වය අගය කිරීම සඳහා මෙම දිනය සමරනු ලැබේ.

## ක්‍රියාකාරකම්වල සාරාංශය

- ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සෑම වසරකම ඔක්තෝබර් පළමු වැනි දින ජාත්‍යන්තර වැඩිහිටි දිනය සමරණු ලබයි.
- 2022 ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම සෙත්සිරිපාය, බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයේ 6 වන මහලේ ශ්‍රවණාගාරය තුළදී පැවැත්විණි.
- මෙහිදී වැඩිහිටි සුභසාධනය සඳහා රක්ෂණාවරණ වැඩ සටහන් හඳුන්වාදුන් අතර එය "වැඩිහිටි සුවසරණ" නමින් හඳුන්වන ලදී.
- ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ම නියෝජනය වන පරිදි ආගමික වැඩසටහනක්ද පැවත්විණි.
- මාදිවෙල, ඊයම්පෝරුව රජමහා විහාරස්ථානයේ පැවත්වූ ආගමික වැඩසටහන සඳහා සම්භාවනීය අමුත්තන්, වැඩිහිටි සමිති සාමාජිකයින් සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ නිළධාරීන්ද සහභාගීවූහ.
- ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ සංවිධානයෙන් මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක විය.





## ✔ යහපත් ක්‍රියාකාරකම් පිළිබඳව හැඳින්වීම

### සෞඛ්‍ය රක්ෂණාවරණ පිළිබඳව හැඳින්වීම

ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුමට සමගාමීව ශ්‍රී ලාංකීය වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය සඳහා "වැඩිහිටි සුවසරණ" නමින් සෞඛ්‍ය රක්ෂණ වැඩසටහනක් නිළ වශයෙන් හඳුන්වා දෙන ලදී.

- ශ්‍රී ලංකා රක්ෂණ සමාගම මගින් මෙම රක්ෂණාවරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.
- 2022 ඔක්තෝබර් පළමුවැනි දින ප.ව. 1.00 ට කාන්තා ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ සිව්වන මහලේ පිහිටි ශ්‍රවණාගාරයේදී මෙම වැඩසටහන පවත්වන ලදී.
- කාන්තා ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා හා ලේකම් තුමාගේ නායකත්වය යටතේ මෙම වැඩසටහන පවත්වන ලදී.
- වැඩිහිටියන් සඳහා වන ජාතික සභාවේ සාමාජිකයින්, බස්නාහිර පළාත් වැඩිහිටි සභාවේ සාමාජිකයින්, කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිහිටි සභාවේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන අයද මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ.
- වැඩිහිටියන් 25 දෙනෙකුද මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ.





### පුණ්‍යාගමික වැඩසටහන

වර්ථමාන ආර්ථික අර්බුධය හේතුවෙන් වැඩිහිටි පිරිස විශාල වශයෙන් ප්‍රශ්න වලට මුහුණ දෙමින් සිටියි. එම හේතුවෙන්, ඔවුන්ගේ මානසික සෞඛ්‍ය යහපත් තත්වයක තිබේදැයි කිව නොහැක. එම නිසා, ඔවුන්ට මානසික සහ අධ්‍යාත්මික සහනයක් ලබාදීම සඳහා බෝධිපූජාමය පිංකම පවත්වන ලදී.

- ➢ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමන්, ලේකම් තුමන් සහ ජාතික වැඩිහිටි සභා සාමජිකයින්ගේ නායකත්වයෙන් මෙම බෝධිපූජාමය පිංකම 2022 නොවැම්බර් පළමු වැනිදින ප.ව. 4.00 සිට ප.ව. 5.00 දක්වා පැවැත්විණි.



# ප්‍රජාව තුළ වැඩිහිටි සේවයේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා වූ JICA ව්‍යාපෘතිය (ProCEES)

- කොළඹ දිස්ත්‍රික් ලේකම් හා මහරගම ප්‍රාදේශීය ලේකම්ගේ සහභාගගිත්වයෙන් ද, වැඩිහිටි ප්‍රජාව 150 පමණ පිරිසකගේ ද, ආරාධිත අමුත්තන් හා නිලධාරීන් ඇතුළුව සමස්ත පිරිස 250 කගේ සහභාගීත්වයෙන් මෙම පිංකම මාදිවෙල ඊයම්පෝරුව විහාරස්ථානයේදී පැවැත්විණි.

- මෙම වැඩසටහන සඳහා සහභාගී වීමට කැමති වැඩිහිටි පුද්ගලයින් ආසන්නතම ග්‍රාමනිළධාරී කොට්ඨාශයෙන් තෝරාගන්නා ලදී.



## ක්ෂේත්‍රයෙන් ලද පණිවුඩ

වැඩිහිටි ප්‍රජාව යනු රටට ඉතා වැදගත් සම්පතකි. වැඩිහිටි ප්‍රජාව දිනෙන් දින ඉහළ යමින් පවතින නිසා ශ්‍රී ලංකාවට දිගු කාලීන සුභසාධන සකස් කිරීමේ අවශ්‍යතාවයක් පවතී. ඔක්තෝබර් පළමු වැනි දින වැඩිහිටියන්ගේ දිනයයි. පසුගිය අවුරුදු කිහිපය තුළ කොවිඩ්-19 (කොරෝනා) වසංගතය හා ආර්ථික අර්බුධය හේතුවෙන් වැඩිහිටි පිරිසට විවිධ අපහසුතාවලට මුහුණ දීමට සිදුවිණි. එම නිසා, වැඩිහිටි පිරිස ආර්ථික, මානසික, කායික, සමාජීය හා අධ්‍යාත්මික වශයෙන් බලගැනිවීම සඳහා වන සුභසාධනයන්ට උදව් කිරීම අපගේ රාජකාරියයි.



***අස්රින් අබුබකර්***
*වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධන නිළධාරී*
*ජාතික වැඩිහිටි ලේකම් කායීාලය*
*සෙත්සිරිපාය*

“වයසට යාමත් සමග වැඩිහිටි පිරිස කායික හා මානසික යන දෙයාකාරයෙන්ම දුර්වල වෙනවා. වැඩිහිටි පිරිස වෙනුවෙන් අප විසින් දැරිය යුතු වගකීම් මොනවද කියන එක ජ්‍යාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම තුළින් ඉස්මතුවෙනවා. වැඩිහිටි ජාතික ලේකම් කායීාලය මගින් මෙවැනි වැඩසටහන් ආරම්භ කිරීම ගැන අපි ආඩම්භර වෙනවා. “



***සකුන්තලා මංචනායක***
*වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධන නිළධාරී*
*ජාතික වැඩිහිටි ලේකම් කායීාලය*
*සෙත්සිරිපාය*

## සංස්කාරකගේ පණිවුඩය

සැම අවුරුද්දකම ඔක්තෝබර් පළමුවැනි දින ජ්‍යාත්‍යන්තර වැඩිහිටි දිනය සමරනු ලබයි. ඇතැම්විට සමාජයෙන් නොසලකාහරින වැඩිහිටි පුරවැසියන්ගේ වැදගත්කම කෙරෙහි අවධානය යොමු කිරීම මෙම දිනය සැමරීම මගින් සිදුකෙරේ. මෙම දිනය වැඩිහිටියන්ට ඔවුන්ගේ ජීවිත සතුටින් ගතකිරීම සඳහා අප විසින් සළකාබැලිය යුතු වගකීම් අවධාරණයකරයි. වැඩිහිටියන්ට බලපාන ගැටලු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ඔවුන්ගෙන් සමාජයට සිදුවන මෙහෙවර අගයකිරීම මෙම දිනයේ ප්‍රධාන අරමුණු වේ. ඔවුන්ට දිගුකාලීනව සත්කාර ලබාදීම සහ ඔවුන්ට සෞඛ්‍යමත් වියපත්වීමක් සඳහා දායකවීම අපගේ වගකීමය. ජාතික වැඩිහිටි මහලේබම් කායීාලය මගින් අවුරුදු 60 ට වැඩි පුද්ගලයින් සඳහා විවිධ සත්කාරක වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එය ඉතා ප්‍රශංශනීයයි.



***සඳුනි ජයරත්න***
*ව්‍යාපෘති නිළධාරී*
***JICA ProCEES***

කරුණාකර ඔබේ ප්‍රජාව තුළ සිදු වන යහපත් ක්‍රියාකාරකම්
jica.procees@gmail.com වෙත යවන්න

තරුණ, වැඩිහිටි සහ ආබාධිත අධ්‍යක්ෂක මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, කාන්තා ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමත්‍යාංශය, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ප්‍රජාව තුළ වැඩිහිටි සේවයේ ධාරිතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය.

ව්‍යාපෘති කාර්යාලය
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය (NSE),
ලිපිනය: D බ්ලොක්, 2 වන මහල, සෙත්සිරිපාය අදියර (II), බත්තරමුල්ල, කොළඹ
විද්‍යුත් තැපැල: jica.procees@gmail.com